කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

# BMGT E3045 – සංකාර්ය කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

01. (අ) i. ''සංකාර්ය පද්ධතිය'' යන්න නිර්වචනය කරන්න.

ii. නිෂ්පාදන හා සංකාර්ය කළමනාකරණය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා සංකාර්ය පද්ධතිය උපකාරී වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) i. ඔබ කැමති ඕනෑම සේවා ආයතනයක පද්ධති පෙනුම රූප සටහනක් ලෙස පෙන්වන්න.

ii. එහි ඇති විවිධ වූ සංරචක හඳුනාගෙන නම් කරන්න.

iii. එහි ඇති පරිවර්තන ක්‍රියාවලිය විස්තර කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

02. (අ) i. පාරිභෝගිකයකුගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීමට අදාළවන්නා වූ විවිධ පියවරයන් විස්තර කරන්න.

ii. මෙම පියවරයන්ගෙන් කුමන පියවරයන්, නිෂ්පාදන හා සංකාර්ය කළමනාකරණයේ කොටස් වන්නේද? පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) i. භාණ්ඩයක තිමාව/ මාදිලිය යනු කුමක්ද?

ii. මාදිලි ආකාරය (form design) සහ මාදිලි කාර්යපරය (functional design) අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

iii. නිෂ්පාදන මාදිලියට (product design) බලපාන සාධක මොනවාද?

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

03. (අ) i. ක්‍රම අධ්‍යයනය (method study) යනු කුමක්ද?

ii. ක්‍රම අධ්‍යයනයට (method study) අදාළ විවිධ වූ පියවරයන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ආ) i. "වැඩ මිණුම්" යන පදය නිර්වචනය කරන්න.

ii. වැඩ මිණුම් ක්‍රියාවලියේ පියවරයන් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 07)

(ඇ) ABC ආයතනයේ වැඩ මිණුම් අධ්‍යයනයක් සිදුකරන ලදි. පැය අටේ වැඩ දිනක් සඳහා පහත සඳහන් ප්‍රතිඵල ලබාගන්නා ලදි.

| | |
|---|---|
| නිෂ්පාදන ඒකක | 300 |
| අක්‍රිය කාලය | 10% |
| කාර්යඵල අනුපාතිකය | 120% |
| දීමනා කාලය සාමාන්‍ය කාලයෙන් | 15% |

කාර්යය සඳහා ප්‍රමත කාලය ගණනය කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

04\. (අ) i. නිෂ්පාදනාගාරයක් ස්ථානගතකිරීම සඳහා බලපානු ලබන ප්‍රධාන සාධක කවරේද?

ii. පහත සඳහන් ඒවා ස්ථානගත කිරීමේදී සලකාබලනු ලබන ප්‍රධාන සාධක කවරේද?

I. පෙර පාසලක් (Nursery school)

II. ගෑස් භාවිතාකරන පොහොර කම්හලක්

III. ක්ෂණික ආහාරපාන ආපනශාලාවක්

(ලකුණු 10)

(ආ) ක්‍රීඩා භාණ්ඩ නිපදවන ආයතනයක්, ටෙනිස් පිති නිපදවීම සඳහා ඒකකයක් ඇතිකිරීමට අදහස් කරයි. මේ සඳහා A, B, සහ C යන ස්ථාන පිළිබඳ සලකා බලමින් සිටියි. මෙම ස්ථාන සඳහා අදාළ පිරිවැය දත්ත පහත වගුවෙන් දී ඇත.

| ස්ථානය | ස්ථාවර පිරිවැය | විචල්‍ය පිරිවැය |
|---|---|---|
| A | රු. 50, 000 | රු. 135 |
| B | රු. 100, 000 | රු. 110 |
| C | රු. 120, 000 | රු. 120 |

එක් පිත්තක විකුණුම් මිල රු. 300 ක් සහ වාර්ෂික ඉල්ලුම ඒකක 3000 ක් ද නම් කුමන ස්ථානය ඔබ විසින් අනුමත කරන්නේද? (ඔබගේ පිළිතුර සනාථ කරන්න)

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. (අ) i. නිෂ්පාදිත බිම් සැලැස්ම සහ ක්‍රියාවලි බිම් සැලැස්ම අතර ඇති වෙනස කුමක්ද?

ii. ගණුදෙනුකරු අභිමුඛ බිම්සැලැස්මක දැකියහැකි පෙලවැටුම් බලපෑම (Waiting line effect) පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) "ඵලදායිතාවය ඉහළ දැමීමේ සෘජු ක්‍රමයක් වන්නේ මාර්ග තුල්‍යකරණය පවත්වා ගැනිමයි"

ඉහත ප්‍රකාශය සුදුසු උදාහරණයක් යොදාගනිමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

(ඇ) එකලස් කිරීමේ මගක අඩංගු පහත කාර්යයන් දී ඇති අනුපිළිවෙල අනුව අදාළ කාලයන් තුල කළයුතුය.

| කාර්යය | කාර්යය කාලය (තත්පර වලින්) | පෙර කළයුතු කාර්යය/කාර්යයන් |
|---|---|---|
| A | 50 | - |
| B | 40 | - |
| C | 20 | A |
| D | 45 | C |
| E | 20 | C |
| F | 25 | D |
| G | 10 | E |
| H | 35 | B,F,G |

i. කාර්යයන් සඳහා ක්‍රියාකාරකම් ජාලය ගොඩනගන්න.

ii. පැය අටක වැඩ දිනයක් සඳහා පුරෝකථන ඒකක 400 ක ඉල්ලුමට ලඟාවීම සඳහා අවශ්‍යවන න්‍යායාත්මක අවම වැඩ මධ්‍යස්ථාන ගණන කොපමණද?

iii. මාර්ගයේ කාර්යක්ෂමතාවය ගණනය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. (අ) i. ධාරිතාවය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කවරක්ද?

ii. දිගුකාලීන ධාරිතා සැලසුම් තීරණ වලට අදාළ කාර්යයන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) i. සංකාර්ය කළමනාකරුවෙකුට පුරෝකථනය වැදගත් වන්නේ මන්ද?

ii. පුරෝකථනයෙහි ඇති ඩෙල්පි ශිල්පීය ක්‍රමය (Delphi technique) පැහැදිලි කරන්න. ඔබ මෙම ක්‍රමය භාවිතාකරන්නේ කුමන අවස්ථාවලදීද?

iii. පහත දැක්වෙන්නේ භාණ්ඩයක අතීත ඉල්ලුම් වේ.

| මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි |
|---|---|---|---|---|---|---|
| ඉල්ලුම (ඒකක) | 15 | 11 | 12 | 12 | 16 | 17 |

ඒකීය සාත්‍රීය සුමටනය (single exponential smoothing) භාවිතයෙන් ජූලි මාසයේ පුරෝකථනය සොයන්න.

(සුමටන සංගුණයක 0.2 ක් සහ ජනවාරි මාසයේ පුරෝකථනය ඒකක 14 ක් ද විය.)

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

07. (අ) i. ගුණත්වය (quality) සහ ඵලදායකත්වය (productivity) අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

ii. ගුණත්වය හා සම්බන්ධ විවිධ වූ පිරිවැය වර්ග කවරේද? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) i. තොග පාලනයේ (inventory control) අරමුණු මොනවාද?

(ලකුණු 12)

ii. මිනිසකු ප්ලාස්ටික් පෙට්ටි තොග වශයෙන් මිලදීගෙන ඒවා ඔවුන්ගේ නිෂ්පාදිත චොක්ලට් ඇසිරීමට යොදාගනියි. ඔහුට වාර්ෂිකව අවශ්‍යවන පෙට්ටි ප්‍රමාණය 1200 කි. එක් පෙට්ටියක පිරිවැය රු. 30 කි. ඔහු ඇස්තමේන්තු කරනලද ඇණවුම් පිරිවැය ඇණවුමකට රු. 10 ක් ද පවත්වාගැනීමේ පිරිවැය 20% ද වේ.

(a) ඔහුගේ පිරිවැය අවම කරගැනීම සඳහා වරකට ඇණවුම් කලයුතු පෙට්ටි ගණන කොපමණද?

(b) සැපයුම්කරු විකුණන්නේ පෙට්ටි 25 බැගින් වන තොග පමණක්නම්, ඔහු විසින් මිලදීගත යුත්තේ පෙට්ටි 50 ක්ද නැත්නම් 75 ක්ද? (ඔබගේ ගණනයකිරීම් පෙන්වන්න)

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

08. (අ) i. ද්‍රව්‍ය කළමනාකරණය යනු කුමක්ද?

ii. නිෂ්පාදන මෙහෙයුමක ද්‍රව්‍ය කළමනාකරණය නිෂ්පාදන මෙහෙයුමක් නොවන ද්‍රව්‍ය කළමනාකරණයෙන් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 04)

(ආ) නිෂ්පාදන සමාහාර සැලසුම් සහ සේවා සමාහාර සැලසුම් අතර පවතින ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

(ඇ) සමාගමක් එහි නිෂ්පාදිතයන් සඳහා ඉදිරි මාස 3 ට නිෂ්පාදන සැලැස්මක් සකස්කරමින් සිටියි. පහත වගුවෙන් තොරතුරු ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම් සහ වැඩකරන දින ගණන

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු |
|---|---|---|---|
| ඉල්ලුම | 1600 | 1700 | 900 |
| වැඩකරන දින ගණන | 25 | 23 | 24 |

අනෙකුත් තොරතුරු

තොග පවත්වාගැනීමේ පිරිවැය ඒකකයකට රු.200/= (මාසයකට), (faying off) කුලියට ගැනීමේ සහ ඇණවුම් කිරීමේ පිරිවැය සේවකයකුට රු. 400. අස්කිරීමේ පිරිවැය සේවකයකුට රු. 500.

| | |
|---|---|
| ඒකකයක් සඳහා අවශ්‍ය කාලය | - ශ්‍රම පැය 5 යි |
| සාමාන්‍ය කාල වැටුප් | - පැයකට රු. 10.00 |
| අතිකාල වැටුප් | - පැයකට රු. 15.00 |
| ආරම්භක තොගය | - ඒකක 400 |
| වර්තමාන සේවක ගණන | - 40 |
| ආරක්ෂිත තොගය | - මාසික ඉල්ලුමෙන් 25% කි. |

லුහුබැඳීමේ උපක්‍රමය (chase strategy) භාවිතාකර සමාහාර සැලැස්මක් සංවර්ධනය කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)